සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

**නම/විභාග අංකය :-** ........................................................ **කාලය: පැය 03යි.**

## I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) නිර්වාචික සන්නිවේදනය ප්‍රබල ලෙස භාවිත කළ හැකි සන්නිවේදන ප්‍රභේදය වනුයේ,
(1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය යි. (2) සමූහ සන්නිවේදනය යි.
(3) පුද්ගලාන්තර සන්නිවේදනය යි. (4) ජන සන්නිවේදනය යි.

(02) දකුණේ සිට වමට ලේඛනයේ යෙදෙන භාෂාව වන්නේ,
(1) චීන භාෂාව (2) අරාබි භාෂාව (3) සිංහල භාෂාව (4) හින්දි භාෂාව

(03) මුද්‍රණ ශිල්පය ලෝකයට හඳුන්වා දුන්නේ,
(1) චීන ජාතිකයන් ය. (2) ජර්මන් ජාතිකයන් ය. (3) බ්‍රිතාන්‍ය ජාතිකයන් ය. (4) ජපන් ජාතිකයන් ය.

(04) සන්නිවේදනය ඒකමාර්ගික බව දක්වූ සන්නිවේදන ආකෘති අයත් වරණය වනුයේ,
(1) ලැස්වෙල් ආකෘතිය හා ෂැනොන් වීවර් ආකෘතිය යි.
(2) ලැස්වෙල් ආකෘතිය හා ශ්‍රාම් - මස්ගුඩ් ආකෘතිය යි.
(3) ෂැනොන් වීවර් ආකෘතිය හා ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘතිය යි.
(4) ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘතිය හා HUB ආකෘතිය යි.

(05) සන්නිවේදන වර්ගීකරණයට පාදක වූ සාධක වන්නේ,
(1) සන්නිවේදක හා ග්‍රාහක භූමිකා හුවමාරුවයි.
(2) සන්නිවේදක භාවිත කරන ක්‍රම ශිල්ප මතයි.
(3) ග්‍රාහකයා ප්‍රතිචාර දක්වන ආකාර අනුවයි.
(4) සන්නිවේදන ක්‍රියාවලියට සහභාගිවන පිරිසේ ප්‍රමාණය මතයි.

(06) මේ අතුරින් දොරටු පාලකයෙකු නොවන්නේ,
(1) ප්‍රධාන කතෘය. (2) දැන්වීම්කරුවන්ය. (3) මහජනතාවය. (4) සංස්කාරකවරුන් ය.

(07) උදෑසන පාසල් මාධ්‍ය ඒකකය විසින් ප්‍රචාරය කළ ගුවන් විදුලි වැඩසටහන හදිසියේ සිදු වූ විදුලි විසන්ධිය නිසා අඩාල විය. මෙය සන්නිවේදන න්‍යායට අනුව,
(1) අර්ථ බාධාවකි. (2) සංජානන බාධාවකි.
(3) මාධ්‍ය බාධාවකි. (4) අර්ථ හා මාධ්‍ය බාධාවකි.

(08) මානව සන්නිවේදනයේ පදනම වන්නේ,

(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි. (2) සමූහ සන්නිවේදනයයි.
(3) පුද්ගලාන්තර සන්නිවේදනයයි. (4) නිර්වාචික සන්නිවේදනයයි.

- **ප්‍රශ්න අංක 09 - 12 දක්වා පහත ප්‍රකාශ කියවා අදාළ අක්ෂරය තෝරන්න.**

A - ප්‍රදීපාගාර උපක්‍රමය.

B - තැපැල් ලිපි.

C - ශබ්ද විකාශන යන්ත්‍ර.

D - ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණය ප්‍රමාද වීම.

E - තමා නොහඳුනන ග්‍රාහක පිරිසට ඇමතීම.

F - සබකෝලයෙන් තොර වීම.

G - රූපවාහිනි තිර

H - කෙටි පණිවිඩ

(09) සමූහයක් ඇමතීමේ දී කථිකයා අනුගමනය කළ යුතු පියවරක් හෝ පියවර වන්නේ,

(1) A ය. (2) A හා E (3) E ය. (4) A හා F ය.

(10) මේ අතුරින් සමූහ සන්නිවේදනයට හා පුද්ගලාන්තර සන්නිවේදනයට භාවිත කළ හැකි තාක්ෂණික මෙවලම් පිළිවෙලින් දක්වා ඇත්තේ,

(1) A හා G ය. (2) C හා H ය. (3) B හා H ය. (4) B හා C ය.

(11) මෙහි D හා E බහුලව දැකිය හැකි වන්නේ,

(1) ජනසන්නිවේදනයේ දී ය. (2) සමූහ සන්නිවේදනයේ දී ය.
(3) පුද්ගලාන්තර සන්නිවේදනයේ දී ය. (4) වාචික සන්නිවේදනයේ දී ය.

(12) මෙහි A යටතේ දක්වා ඇති උපක්‍රමය භාවිතයට ගත හැකි සන්නිවේදන අවස්ථාවක් වන්නේ,

(1) බසයේ කොන්දොස්තර සමග කතා කිරීමේ දී ය.
(2) වෛද්‍යවරයා, වෛද්‍ය සම්මන්ත්‍රණයක් අමතන විට දී ය.
(3) රූපවාහිනී ප්‍රවෘත්ති ඉදිරිපත් කරන විට දී ය.
(4) නිහඬව කල්පනාකරන විට දී ය.

(13) සඳුනී සාහිත්‍ය සමිතියේ ගීතයක් ගායනා කළේ ඊට ගැලපෙන ඉරියවු හා අභිනයන් නිරූපණ කරමිනි. මෙහි දී සඳුනී භාවිත කළ සන්නිවේදන ස්වරූප වන්නේ,

(1) වාචික හා දෘශ්‍යය සන්නිවේදනය යි. (2) අවාචික සන්නිවේදනය යි.
(3) අව්ධිමත් සන්නිවේදනය යි. (4) වාචික හා අවාචික සන්නිවේදනය යි.

(14) කඩදාසිය හා මුද්‍රණ යන්ත්‍රය සොයා ගත්තේ,

(1) ලැස්වෙල් හා වීවර් විසින් ය. (2) ට්සායි ලුන් හා ග්‍රැහැම්බෙල් විසින් ය.
(3) ට්සායි ලුන් හා ගුටෙන්බර්ග් විසින් ය. (4) මෝස් හා ට්සායි ලුන් විසින් ය.

(15) අන්තර්ජාලය ඔස්සේ ජනමාධ්‍ය එකිනෙකට හමු වීමේ සන්නිවේදන සංකල්පය,

(1) නවමාධ්‍යය යි (2) ජනමාධ්‍යය යි. (3) අභිසාරී මාධ්‍යය යි. (4) ගෝලීයකරණය යි.

(16) සන්නිවේදන ක්‍රියාවලියක ආරම්භය සනිටුහන් කරන්නේ,

(1) සන්නිවේදකයා ය. (2) ග්‍රාහකයා ය. (3) සන්දේශය යි (4) මාධ්‍යය යි.

(17) දුරකථන සන්නිවේදනය පදනම් කරගෙන යාන්ත්‍රික සන්නිවේදන ආකෘතියක් හඳුන්වා දුන්නේ,

(1) ශ්‍රාම් - ඔස්ගුඩ් විසිනි. (2) ක්ලෝඩ් ෂැනොන් විසිනි.

(3) ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් විසිනි. (4) හැරල්ඩ් ඩී ලැස්වෙල් විසිනි.

(18) ඉහත ගණිතමය ආකෘතියට අයත් සන්නිවේදන මූලිකාංගයක් වන්නේ,

(1) මාධ්‍යය (2) බාධාය (3) ප්‍රතිචාරය (4) තොරතුරු මූලාශ්‍රය

(19) යම් කිසි සන්දේශයක් ග්‍රාහකයාට ලැබුණු පසු ග්‍රාහකයා තුළ ඇතිවන ආකල්පමය හා චර්යාමය වෙනස,

(1) ප්‍රතික්‍රියාවයි. (2) ප්‍රතිපෝෂණයයි. (3) පෙළඹවීමයි. (4) බලපෑමයි.

(20) ජනමාධ්‍ය හා නොගැළපෙන වරණය තෝරන්න.

(1) වාණිජවාදී අරමුණුවලින් යුතු ය.

(2) ආයතනගතව ක්‍රියාත්මක වේ.

(3) සෑම විටම ග්‍රාහක කැමැත්ත මත සන්දේශ ඉදිරිපත් කරයි.

(4) අනුග්‍රාහක දැන්වීම් සඳහා ගුවන් කාලය හා ඉඩ ප්‍රමුඛව වෙන්කරයි.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

නම/විභාග අංකය :- ..........................................................

## II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) මානවයා මෙලොව දුටු මොහොතේ සිට මානව සන්නිවේදනයද ආරම්භ වූ බව විද්වත් මතයයි. එම නිසා ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිත කළ සන්නිවේදන උපක්‍රම ප්‍රථමික මානව සන්නිවේදන ක්‍රම ලෙස හඳුන්වයි. වර්ථමානය වන විට මානව සන්නිවේදනය මගින් විධිමත් භාෂා බිහි වීමෙන් ද තාක්ෂණය හා බද්ධ වීමෙන් ද තවත් දියුණු වී ඇත.

(1) මානව සන්නිවේදනය යන්න අර්ථ කථනය කරන්න.
(2) ප්‍රාථමික සන්නිවේදන ක්‍රම දෙකක් නම් කරන්න.
(3) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා සන්නිවේදනය කළ බවට හමුවන සාක්ෂි දෙකක් නම් කරන්න.
(4) මානවයාට සන්නිවේදනය අවශ්‍ය වීමට බලපාන හේතු දෙකක් ලියන්න.
(5) ඈත අතීතයේ මානවයා පණිවිඩ හුවමාරු කරගත් ආකාර දෙකක් නම් කරන්න.
(6) මානව සන්නිවේදනය සඳහා වර්තමානයේ භාවිත කරන තාක්ෂණික මෙවලම් දෙකක් නම් කරන්න.
(7) එම තාක්ෂණික මෙවලම් නිසා මානව සන්නිවේදනයේ සිදුවූ ප්‍රවණතා දෙකක් නම් කරන්න.
(8) සත්ත්ව සන්නිවේදනය සඳහා නිදසුන් දෙකක් ලියන්න.
(9) සම්ප්‍රදායික සන්නිවේදක ක්‍රම දෙකක් නම් කරන්න.
(10)සන්නිවේදන ක්‍රියාවලියකට දක්නට ලැබෙන සන්නිවේදන මූලිකාංග හතරක් නම් කරන්න.

(ලකුණු 2×10 = 20)

(02) (1) සන්නිවේදන පිළිබඳ ලැස්වෙල් නිර්වචනය ලියන්න. (ලකුණු 01)
(2) ලැස්වෙල් ආකෘතියේ ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 02)
(3) ලැස්වෙල් ආකෘතියේ දක්නට ලැබෙන සන්නිවේදන මූලිකාංග තුනක් කෙටියෙන් පහදන්න. (ලකුණු 03)
(4) සන්නිවේදන ක්‍රියාවලිය ද්වි මාර්ගික වීමේ වාසි දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(03) (1) ''සංජායනය'' යන්න කෙටියෙන් පහදන්න. (ලකුණු 01)
(2) ග්‍රාහකයාගේ සංජායනයට බාධා කාරී වන හේතු හතරක් නම් කරන්න. (ලකුණු 02)
(3) සන්නිවේදනයේ කාර්යයන් තුනක් කෙටියෙන් පහදන්න. (ලකුණු 03)
(4) සන්නිවේදන ක්‍රියාවලියේ දී සිදු විය හැකි ප්‍රධාන බාධක වර්ග දෙක නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04)

(04) (1) දොරටුපාල සංකල්පය (Gatekeeper concept) කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 01)

(2) පුද්ගලාන්තර සන්නිවේදනය යන්න කෙටියෙන් හඳුන්වා එහි අරමුණු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(3) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ විශේෂතා තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(4) සිතුවිලි හසුරුවා ගැනීම සන්නිවේදන ක්‍රියාවලියට වැදගත් වන ආකාරය කරුණු දෙකක් මගින් පහදන්න. (ලකුණු 04)

(05) (1) ජන සන්නිවේදනයේ ප්‍රධාන කාර්යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 01)

(2) ජන සන්නිවේදනයේ කැපී පෙනෙන ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 02)

(3) වාචික සන්නිවේදනය කෙටියෙන් හඳුන්වා භාෂාවේ මූලික කාර්යයන් දෙකක් කෙටියෙන් පහදන්න. (ලකුණු 03)

(4) ජනමාධ්‍ය මගින් සමාජය වෙත එල්ලකරන අයහපත් බලපෑම් දෙකක් නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 04)